බන්ධ:කො:ජ: චක්‍ර ලේඛ අංක: 17 /2017

මගේ අංකය: කේ.03/51/ 151/17,
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09,
2017.09.28 දින.

සියලුම බන්ධනාගාර අධිකාරීන් හා
සහකාර බන්ධනාගාර අධිකාරින් වෙත.

**2018 වසරට ආගමික වතාවත් සිදුකිරිම සඳහා පූජකවරුන් පත් කිරිම**

2017 වර්ෂය තුල බන්ධනාගාර ආයතන වල රඳවන ලද සිර/සැක නේවාසිකයින් වෙනුවෙන් ආගමික වතාවත් සිදු කිරිම සඳහා බන්ධ: කො: ජ: චක්‍ර ලේක අංක: 08/2017 මගින් මා විසින් පත්කරන ලද පූජකවරුන්ගේ දූරකාලය 2017.12.31 වෙනි දිනෙන් අවසන් වන බැවින් ; 2018 වර්ෂය සඳහා අළුතින් පූජකවරුන් පත් කිරිමට නියමිතව ඇත.

02. එසේ හෙයින් ඔබ ආයතනයේ හා ඊට අනුබද්ධ බන්ධනාගාර ආයතනවල රඳවා සිටින සියළුම කාන්තා සහ පිරිමි සිර / සැකකරුවන් හට ආගමික වතාවත් සිදුකිරිමට පහත සඳහන් කර ඇති ආකෘති පත්‍රයට අනුකූලව නිවැරදිව සැකසූ පූජකවරුන්ගේ නාමලේඛණයක් 2017.11.05 වෙනි දිනට පෙර මා වෙත එවිමට කටයුතු කරන ලෙස දන්වමි.

03. මෙම පූජකවරුන් පත්කිරිමේදී දැනට ආගමික වතාවත් සිදු කිරිමට පත් කර ඇති පූජකවරුන් විසින් ආයතනයේ නේවාසිකයින් වෙනුවෙන් අදාල වර්ෂය තුල හරියාකාරව නියමිත ආගමික කටයුතු සිදුකර තිබේද යන්න හා නේවාසිකයින් වෙනත් ආගම් වලට හැරවීම , බන්ධනාගාර පරිපාලනය විවේචනය වන පරිදි කටයුතු සිදුකර ඇත්ද යන කරුණු පිළිබඳව ඔබ විසින් පූර්ණ ඇගයිමක් සිදුකර සුදුසු පූජකවරුන්ගේ නම් ඇතුලත් වන පරිදි අදාල නාමලේඛණය සැකසිමට කටයුතු කල යුතුය.

04. තවද , පසුගිය කාලය තුල ආගමික වතාවත් ඉටුකරන ලද ආකාරය හා පූජකවරුන්ගෙන් නේවාසිකයින් හට හරියාකාරව එම කටයුතු සිදුවුවාද යන කරුණු ගැන සලකා බලා එසේ නිසියාකාරව කටයුතු සිදුනොකල පුද්ගලයින් හා සංවිධාන වල නම් ඉවත්කර අළුතින් පත්කරන සුදුසු පූජකවරුන්ගේ නම් පමණක් ඇතුලත් කල යුතුය. එසේ සිදුකරනු ලබන වෙනස් වීම් පිළිබඳව අදාලව සංෂිප්තව සැකසූ වාර්තාවක් ඉදිරිපත් කිරිමට කටයුතු කිරිමට පියවර ගන්න.

05. ඉහත සඳහන් පරිදි පූජකවරුන් පත් කිරිමේදී ඔබ විසින් පෞද්ගලිකවම ඔබ ආයතනය වෙත පත්කිරිමට තෝරා ගැනිමට නියමිත බෞද්ධ , කතෝලික / ක්‍රිස්තියානි (නිකායන්) , ඉස්ලාම් , හින්දු ආගම් වලට අයත් පූජකවරුන් 2018 වර්ෂයේ ඔබ ආයතනය තුල නේවාසිකයින් හට ආගමික වතාවත් සිදුකිරිම සම්බන්ධයෙන් එක් එක් ආගමට අයත් බන්ධනාගාර බල ප්‍රදේශයේ ප්‍රධාන නායක ස්වාමින් වහන්සේ , බිෂොප් තුමා / ( ප්‍රධාන පියතුමෙක්) , ප්‍රධාන මව්ලව් පූජකතුමා , ප්‍රධාන කුරුක්කල් තුමාගෙන් එකගතාවය වෙන් වෙන් වශයෙන් ලිඛිතව ලබා ගැනිමට කටයුතු කර , එම එකගතාවය සමග මා වෙත අදාල නාමලේඛණය ඉදිරිපත් කල යුතුය.

06. එල්.ටී.ටී.ඊ නේවාසිකයින් රඳවන ලද ආයතන වල පූජකවරුන් තෝරා ගැනිමේදී එසේ තොරාගන්නා පූජකවරුන් අයත් පොලිස් බල ප්‍රදේශයේ පොලිසිය මගින් පොලිස් වාර්තාවක් ලබාගෙන ඒ අනුව අදාල නම් ඇතුලත් කිරිම වඩාත් යෝග්‍ය වන බව දන්වන අතර , අදාල සෑම පූජකවරයෙකුම පත් කිරිමට පෙර අදාල එක් එක් ආගමේ ප්‍රධාන පූජක තුමා සමග සාකච්ඡා කර තෝරාගෙන ආයතනයේ සිටින නේවාසිකයින් සංඛ්‍යාවට සරිලන ප්‍රමාණයට පමණක් ගැලපෙන පරිදි තෝරා ගනු ලබන නම් ලැයිස්තුවක් පමණක් නියමිත දිනට එවිමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

<u>2018 වර්ෂය සඳහා පූජකවරුන් පත් කිරිම</u>

.......................................බන්ධනාගාරය

| බෞද්ධ | නේවාසික සංඛ්‍යාව | කතෝලික | නේවාසික සංඛ්‍යාව | ක්‍රිස්තියාණි (නිකායන්) | නේවාසික සංඛ්‍යා | ඉස්ලාම් | නේවාසික සංඛ්‍යා | හින්දු | නේවාසික සංඛ්‍යා | වෙනත් | නේවාසික සංඛ්‍යා |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

එච්.එම්.එන්.සී.ධනසිංහ

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ - 09.